රට රකින පරපුර
தேசத்தைக் காக்கும் தலைமுறை
RATA RAKINA PARAPURA

මාධ්‍ය නිවේදනය. 2026-10-09

**භික්ෂු චීවරයට අත තැබීමෙන් බුද්ධ ශාසනයේ ගෞරවය බිඳ දැමිය නොහැක!**

<u>රට රකින පරපුරේ දැඩි විරෝධය</u>

ශ්‍රී ලංකාව යනු බුද්ධ ශාසනයට ප්‍රමුඛස්ථානය ලබාදීම රාජ්‍ය වගකීමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති රටකි. එවැනි රටක අද සිදුවෙමින් පවතින්නේ කුමක්ද?
භික්ෂූන් වහන්සේලාගේ මතය තම පාර්ශවයේ මතයට එකඟ නොවන විට අපහාස කිරීමත්, විවේචනය කරන විට අවමන් කිරීමත්, අවසානයේ රාජ්‍ය බලය භාවිත කරමින් භික්ෂු චීවරයට පවා අත තැබීමත් සාමාන්‍යකරණය වෙමින් තිබේ.

පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්ගේ චීවරය ඉවත් කර අධිකරණයට ඉදිරිපත් කිරීමේ සිදුවීම මේ තත්ත්වයේ අතිශය බරපතළ සංකේතයක් බව අපි මෙහිදී ඉතා පැහැදිලිව ප්‍රකාශ කරමු.

ඥානසාර හිමියන් නීතියට ඉහළින් සිටිය යුතු යැයි අපි නොකියමු. යම් පුද්ගලයෙකුට එරෙහිව අධිකරණ තීන්දුවක් තිබේ නම් එය නීතිය අනුව ක්‍රියාත්මක කළ යුතුය. අධිකරණයේ ස්වාධීනත්වයට නැවත නැවතත් හිස නමා අපි ගරු කරන්නෙමු.

එහෙත් නීතිය ක්‍රියාත්මක කිරීමේ නාමයෙන් භික්ෂු චීවරයට නිගරු කිරීමට කිසිදු රාජ්‍ය ආයතනයකට අසීමිත බලයක් ලබාදිය නොහැක. බන්ධනාගාර දෙපාර්තමේන්තුව රාජ්‍යය ආයතනයක් ලෙස සිදු කර ඇත්තේ එයයි. මෙය ඥානසාර හිමියන් පිළිබඳ පමණක් ප්‍රශ්නයක් නොවේ.

අද බලය තිබෙන අයෙකුට අකමැති වූ භික්ෂුවකගේ චීවරය ගලවා දැමීම සාධාරණීකරණය කළ හැකි නම්, හෙට එම බලය වෙනත් භික්ෂූන් වහන්සේලාට එරෙහිව ද භාවිත කිරීමට දොර විවෘත වේ.
අද ඉලක්කය ඥානසාර හිමියන් විය හැකිය.

හෙට ඉලක්කය කවුද? තමන්ගේ දේශපාලන බලයට සමපාත නොවන මතයක් දරන වෙනත් භික්ෂුවක්ද? ආණ්ඩුවක් විවේචනය කරන මහානායක හෝ සංඝනායක හිමිනමක්ද? බුද්ධ ශාසනය වෙනුවෙන් හඬ නගන තවත් ස්වාමීන් වහන්සේ නමක්ද?

මෙයයි අප රටක් ලෙස දැඩිව සිතා බැලිය යුතු ප්‍රශ්නය. ආණ්ඩුවට අපගේ ප්‍රශ්නය සරලය.

අංක 153, නව රෝහල් පාර,ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
+94 71 395 0706

නීතිය ක්‍රියාත්මක කළාද, නැතිනම් බලය පෙන්වූවාද? භික්ෂුවකට දඬුවම් කිරීම සහ භික්ෂු චීවරයට අවමන් කිරීම එකක් නොවේ.
නීතිය ඉදිරියේ සෑම පුද්ගලයෙකුම සමාන විය යුතුය.

නමුත් රාජ්‍ය බලය භාවිත කිරීමේදී මානව ගෞරවය, ආගමික ගෞරවය සහ මේ රටේ ශාසනික සම්ප්‍රදායන් ද ආරක්ෂා කළ යුතුය. එසේ නොමැති නම් නීතියේ ආධිපත්‍යය යනු බලවතුන්ගේ කැමැත්ත ක්‍රියාත්මක කිරීමේ මෙවලමක් පමණක් බවට පත්වනු ඇත.

තවත් බරපතළ ප්‍රශ්නයක් තිබේ. මෑත කාලයේ සමාජ මාධ්‍ය ඇතුළු විවිධ වේදිකාවල භික්ෂූන් වහන්සේලා ඉලක්ක කරමින් සිදු කෙරෙන අසභ්‍ය, අපහාසාත්මක සහ ආගමික සංවේදීතාවන් නොසලකා හරින ප්‍රකාශ සම්බන්ධයෙන් රාජ්‍යය පෙන්වන්නේ කුමන ප්‍රතිචාරයක්ද?

භික්ෂුවකට අපහාස කිරීම "නිදහස් අදහස් ප්‍රකාශ කිරීම" ලෙසත්, භික්ෂුවකට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේදී ගෞරවයෙන් සැලකීම "විශේෂ වරප්‍රසාදයක්" ලෙසත් හඳුන්වන දේශපාලන දෙබිඩි පිළිවෙතක් අපි පිළි නොගනිමු.

අපට අවශ්‍ය වන්නේ කිසිවෙකු නීතියට ඉහළින් තැබීම නොවේ. අපට අවශ්‍ය වන්නේ නීතිය සෑම කෙනෙකුටම එකසේ ක්‍රියාත්මක වන රටකි. භික්ෂුවක් වරදක් කළහොත් නීතිය ක්‍රියාත්මක කල යුතු ය. භික්ෂුවක් අපරාධයක් කළහොත් නීතිය ක්‍රියාත්මක කල යුතු ය.
භික්ෂුවක් අධිකරණයෙන් දඬුවම් ලැබුවහොත් දඬුවම ක්‍රියාත්මක කරන්න.

නමුත් චීවරය පළිගැනීමේ මෙවලමක් බවට පත් නොකරන්න.

රට රකින පරපුර ලෙස අප අවධාරණය කරන්නේ,

1. පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්ගේ චීවරය ඉවත් කිරීමට ගත් තීරණයට අදාළ සම්පූර්ණ නීතිමය හා පරිපාලන පදනම වහාම රටට පැහැදිලි කළ යුතුය.

2. මෙවැනි තත්ත්වයක් නැවත ඇති නොවන පරිදි භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් බන්ධනාගාර සහ රාජ්‍ය ආයතන ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ පැහැදිලි ක්‍රමවේදයක් ප්‍රකාශයට පත් කළ යුතුය.

3. භික්ෂූන් වහන්සේලාට එරෙහිව සිදු කෙරෙන අපහාස සහ ආගමික අවමන් සම්බන්ධයෙන් නීතිය තෝරා බේරා නොගෙන ක්‍රියාත්මක කළ යුතුය.

4. බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති රාජ්‍ය වගකීම වචනවලට පමණක් සීමා නොකර ප්‍රායෝගිකව ඉටු කළ යුතුය.

අපි කිසිදු පුද්ගලයෙකුගේ අපරාධයකට ආගමික ආවරණයක් ලබාදීමට සූදානම් නැත. එමෙන්ම රාජ්‍ය බලය භාවිත කරමින් ආගමික ගෞරවය පාගා දැමීම සාධාරණීකරණය කිරීමටද අපි කිසිසේත් සූදානම් නැත.

මෙය දේශපාලන පක්ෂයක ප්‍රශ්නයක් නොවේ. මෙය එක් භික්ෂුවකගේ ප්‍රශ්නයක් පමණක්ද නොවේ. මෙය ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනයට, ආගමික නිදහසට සහ නීතියේ ආධිපත්‍යයට අදාළ ප්‍රශ්නයකි.

ඒ නිසා අප යලි යලිත් මතක් කර දෙන්නේ
බලය තාවකාලිකය. ආණ්ඩු වෙනස් වේ. දේශපාලනඥයන් වෙනස් වේ. නමුත් බුද්ධ ශාසනය මේ රටේ සහස්‍ර ගණනාවක් පුරා පැවත එන්නකි. එබැවින් කිසිදු ආණ්ඩුවකට තම දේශපාලන බලය භාවිත කරමින් භික්ෂු චීවරය අවමන් කිරීමට හෝ බුද්ධ ශාසනයේ ගෞරවය දේශපාලන පළිගැනීම්වලට යටත් කිරීමට අයිතියක් නැත.

නීතියට ගරු කරමු.
අධිකරණයට ගරු කරමු.
සසුනටත් ගරු කරමු.
චීවරයට අත නොතබනු!

බුද්ධ ශාසනය දේශපාලන පළිගැනීම්වලට ගොදුරු නොකරනු !

-----------------------------------------------

කාන්චන ද සිල්වා
ලේකම් රට රකින පරපුර